# ආගමන සමයේ පළමුවන ඉරුදින

## පළමුවන දේව ප්‍රකාශනය යෙසායා 63: 16-17; 64: 1, 3-8

*යෙසායා දිවැසිවරයාගේ පොතෙන් උපටා ගත් කොටසකි*

### අහස දෙබෑ කොට ඔබ නොවඩින්නේ මන්ද?.

ඔබ අපේ පියාණෝ ය; ආබ්‍රහම් අප නොදන්න නමුත්, ඉශ්රායෙල් අප නාඳුනන නමුත්, සමිඳාණෙනි, ඔබ අපේ පියාණෝ ය, අපේ මිදුම්කාරයාණෝ ය. එය අතීතයේ සිට ඔබේ නාමය වේ.

සමිඳුනි, ඔබේ මාර්ගවලින් අප මුළාව යන්නත්, ඔබ කෙරෙහි බිය නොවන සේ අපේ සිත් දැඩි වන්නත් හරින්නේ කුමක් නිසාද? ඔබේ සේවකයන් නිසාත්, ඔබේ උරුමයට අයිති ගෝත්‍ර නිසාත් අප වෙත හැරී එනු මැනව. ඔබ අහස පළාගෙන නොබසින්නේ මන් ද? එවිට කඳු ඔබ තුමාණන් දැක බියෙන් කම්පා වනු ඇත. අප බලාපොරොත්තු නොවූ භයානක දේ එක් කලක ඔබ කළ විට කඳු ඔබ ඉදිරියේ බියෙන් කම්පා වුණේ ය. තමන් කෙරෙහි විශ්වාසය තබන අය උදෙසා මෙවැනි ක්‍රියා කරන දෙවි කෙනෙකු ගැන කනින් අසා තේරුම් ගත්, ඇසින් දුටු කෙනෙක් කිසි කලෙක නොසිටියේ ය.

දැහැමි ක්‍රියාවන් ප්‍රිය කරන, ඔබේ මාර්ගය මෙනෙහි කරන අයට ඔබ මඟ පෙන්වන සේක; අප පව් කළ විට ඔබ අප සමඟ කෝප වී සිටි සේක;

ඔබ කෝප වූ බැවින් අපි පුරාණයේ සිට පාපයෙහි ඇලී ගැලී සිටියෙමු. අපට ගැළැවීම ලැබේ ද?

අපි සියල්ලෝම අපවිත්‍රව සිටියෙමු; අපේ සියළු දැහැමි ක්‍රියා කිළුටු වස්ත්‍ර වැනිය. අපි සියල්ලෝම ගහක කොළ මෙන් පර වී යන්නෙමු. අප කරන අපරාධ නිසා සුළඟ කින් මෙන් අප ගසා ගෙන යයි.

ඔබට යාච්ඤා කරන කිසිවෙක් නැත. ඔබේ පිහිට සොයන කිසිවෙක් නැත; මන්ද, ඔබේ වත සඟවාගෙන අපේ පව් නිසා අපට අපරාධයන්ට ගොදුරු වීමට අපට ඉඩ හැර ඇත. එහෙත් සමිඳුනි, ඔබ අපගේ පියාණෝ ය. අපි මැටි ය; ඔබ අපේ කුඹල් කාරයාණෝ ය. ඔබ අප නිර්මාණය කළ සේක.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 80: 1 – 2, 14–15, 17–19

පිළිතුර : දෙවිඳුනි, අප මිදෙන පිණිස
ඔබේ සිරි වත සිරිය පෙන්වුව මැනව.

ගීය : ජෝසෙප්ගේ පරපුර බැටළු රැළක් මෙන් ගෙන යන
ඉශ්රායෙල්වරුන්ගේ එඬේරාණෙනි, අපට සවන් දුන මැනව.
කෙරුබ්වරුන් මත අසුන් අරා දර්ශනය වුව මැනව.
ඒප්‍රායිම්, බෙන්ජමින් සහ මනස්සේ යන අයගේ
පෙළපත් අබිමුව තේජස් වැජඹෙනු මැනව

අහෝ සව් බලැති දෙවිඳුනි! අප වෙත හැරුණ මැනව.
සගලොව සිට නෙත් යොමා බලා
මේ මිදි වැල වන අප රැකගත මැනව.
ඔබේ දකුණතින් රෝපණය කළ දේ සැලකුව මැනව;
ඔබටම සවිමත් කර ගත් දේ බැලුව මැනව.

ඔබේ හස්තය ඔබේ දකුණු පස සිටින මිනිසා කෙරෙහි පතිත වේ වා!
ඔබේ යහපතට ඔබ ම සවි ශක්තිමත් කළ ජාතිය කෙරෙහි
එය පහළ වේ වා!
එවිට අපි කවදාවත් ඔබට පිටු පා නොයන්නෙමු.

අපට ජීවත් වීමට ඉඩ දුන මැනව.
අපි ඔබේ නාමයෙන් අයැද ඔබ පසසන්නෙමු.
අහෝ සමිඳුනි! සව් බලැති දෙවිඳුනි! අප ආපසු ගෙන ගිය මැනව.
අප මිදෙන පිණිස ඔබේ සිරි වත සිරිය පෙන්වුව මැනව.

## දෙවන දේව ප්‍රකාශනය 1 කොරින්ති 1: 3–9

*පාවුලු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.*

**අපි ස්වාමින් වහන්සේගේ එළිදරව්වීම බලා සිටියෙමු.**

අපගේ පියාණන් වන දෙවියන් වහන්සේගෙන් ද ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගෙන් ද කරුණාවත් ශාන්තියත් ඔබට වේ වා!

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළින් ඔබට දෙන ලද දේව වරප්‍රසාදය නිසා මම නිතර ම ඔබ ගැන මාගේ දෙවියන් වහන්සේට තුති පුදමි. මන්ද, ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ සාක්ෂිය ඔබ තුළ ස්ථිර වී තිබුණ බැවින්, ඔබ උන් වහන්සේ තුළ සියලු ආකාර

දෙසීම් ද සියලු ආකාර දැනගැනීම් ද ඇතුළු සියලු දෙයින් ධනවත් වී සිටින්නහු ය මෙසේ ඔබ කිසි ආත්මික දීමනාවකින් නොඅඩුව අපගේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ එළිදරව් වීම බලාපොරොත්තුව සිටින්නහු ය. අපගේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ විනිශ්චය දිනයේ දී ඔබ නිදොස් ව සිටින පිණිස ඔවුන් වහන්සේ අන්තිමය දක්වා ඔබ ස්ථිර කරන සේක. ස්වකීය පුත්‍ර වූ අපගේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ සහභාගිකමට ඔබ කැඳවා වදාළ දෙවියන් වහන්සේ විශ්වාසවන්ත ය.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද — ගීතාවලිය 85: 7

ආලේලූයා! ආලේලූයා!
සමිඳුනි, ඔබේ තිර පෙම අපට පෙන්නුව මැනව.
ගැලවීමේ පිහිට අපට ද දානය කළ මැනව.
ආලේලූයා!

## සුවිශේෂය — මාක් 13: 33–37

*මාක් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

"කොයි වේලේ ගෘහපතියා එයි දැයි
නොදන්නා හෙයින් අවදිව සිටින්න."

"නියමිත මොහොත කවදා දැයි ඔබ නොදන්න බැවින්, පරෙස්සම් වන්න, අවදි ව ඉන්න. ඒ වනාහි සිය දාසයන්ට බලය ද එකිනෙකාට තම තමන්ගේ වැඩ ද පවරා, 'අවදිව ඉන්නැ' යි දොරටු පාලයාට අණ දී සිය නිවෙසින් පිට වී දුර ගමනක යෙදෙන මනුෂ්‍යයෙකුගේ ආපසු පැමිණීම හා සමාන ය.

ඒ ගෘහපතියා කොයි වේලේ පැමිනේ ද, සවස ද මධ්‍යම රාත්‍රියේ දී කුකුළා හඬලන වේලේ දී ද අළුයම දැයි ඔබ නොදන්නා හෙයින්, ඔහු හදිසියෙන් පැමිණ ඔබ නිදා හිඳිනු නොදක්නා පිණිස අවදිව සිටින්න. ඔබට කියන දෙය හැමටම කියමි. අවදිව සිටින්න."

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*



# “නියමිත මොහොත කවදාදැයි ඔබ නොදන්නා බැවින් අවදිව ඉන්න.”

*ආගමන සමයේ පළමුවන ඉරුදින - 03-12-2017*

*දෙවන වසර*

## හැඳින්වීම

වසර බිලියන ගණනක් පැරණි ලෝක ඉතිහාසය තුළ සිදුවූ වැදගත් ම සිදුවීම කුමක් විය හැකිද? කිතුනුවන් ලෙස අපට ඊට පිළිතුරු දීම අපහසු නැත. සර්වබලධාරී දෙවියන් වහන්සේ මනුෂ්‍ය ස්වභාවයක් ගෙන ලෝකයට ඇතුළු වීමේ ප්‍රාතිහාර්යයට වඩා වැදගත් සිද්ධියක් ලෝක ඉතිහාසය තුළ නොමැත. අද සිට ආගමන කාලය තුළ අප සූදානම් වන්නේ මේ සුවිශේෂ වූ සිද්ධිය සමරන්නටයි. නමුත් මෙය හුදු අතීතාවර්ජනයක් පමණක් නොවන්නේ දෙවියන් වහන්සේට කාලය සීමාවක් නොවන බැවිනි. ආගමන කාලය යනු ක්‍රිස්තුන් වහන්සේ නැවත පැමිණෙන තෙක් බලාපොරොත්තුවෙන් පසුවන කාලයයි. එමෙන්ම උන්වහන්සේ අප එකිනෙකා තුළට පැමිණෙන තෙක් බලාපොරොත්තුවෙන් ද ඒ සඳහා සූදානම් වෙමින් ද ජීවත්වන කාලයයි.

## දේව වචනය

පළමු කියවීමේ ඓතිහාසික පසුබිම නම් ඊශ්‍රායෙල් ජනතාව බබිලෝනියේ විප්‍රවාසයෙන් පසුව නැවත සිය රටට පැමිණි කාලයයි. නමුත් ඔවුන්ගේ දේව මන්දිරය තවමත් නටබුන් ගොඩක් පමණි (යෙසායා 64:11 බලන්න). එහෙයින් දෙවියන් වහන්සේට ස්වර්ගයෙන් බැස ඇවිත් ඔවුන්ට උපකාර කරන ලෙස යෙසායා දිවැසිවරයා ආයාචනා කරයි. තමන්ගේත් ජනතාවගේත් පව් යෙසායා තුමා නොපැකිළව පිළිගනියි. උපකාර කිරීම සඳහා අහස පළාගෙන හෝ පැමිණෙන ලෙස එතුමා දෙවියන් වහන්සේට කන්නලව් කරයි.

**යෙසායා 63:16-17, 64:1,3-8**

**ගීතාවලිය 80:1ඒ-2බී,14-15,17-19**

**1 කොරින්ති 1:3-9**

**මාක් 13:33-37**

ජනවන්දනා චක්‍රයේ දෙවන වසරේ දී වැඩි වශයෙන් දිග හැරෙන්නේ මාක් තුමාගේ සුවිශේෂයයි (සමහර සති වල දී ජුවාම් සුවිශේෂය ද භාවිතා කෙරේ). පසුගිය ඉරිදා කිතිපයේ දී ම අපි අවසාන විනිශ්චය ගැනත් ක්‍රිස්තුන් වහන්සේගේ නැවත පැමිණීම ගැනත් මෙනෙහි කළෙමු. ආගමන කාලයේ පළමු ඉරිදා එහි උච්චස්ථානයයි. සේවකයින්ට වගකීම් පවරා, දොරටු පාලකයාට 'අවදිව ඉන්නැ'යි අවවාද කොට ගමනක් ගිය ගෘහපතියා ක්‍රිස්තුන් වහන්සේ ය. ක්‍රිස්තියානි ආගමික ඇදහිල්ල යනු නිරතුරු අධ්‍යාත්මිකව අවදිව සිටීමක් සහ නොනවත්වා සූදානම් වීමකි. මගේ මරණ මොහොත මට ගෘහපතියා නැවත පැමිණෙන මොහොතයි.



අද දෙවන කියවීම ශු. පාවුලු තුමා කොරින්තිවරුන්ට යැවූ පළමු ලිපියේ (පාවුලු තුමා කොරින්තියේ සංඝයට පළමුවෙන් ම යැවූ ලිපිය මෙය නොවිය හැක. කොරින්ති 5:9 දී එතුමා මීට කලින් යැවූ ලිපියක් ගැන සඳහන් කරයි.) ආරම්භක ආශිර්වාදය ඇතුළත් කොටසයි. මේ කාලයේ දී කොරින්තියේ සංඝය ක්‍රිස්තුන් වහන්සේගේ නැවත පැමිණීම අපේක්ෂාවෙන් පසුවූහ. ස්වාමින් වහන්සේ විනිශ්චයකාරයාණන් ලෙස වඩින කල උන්වහන්සේ හමුවීමට සුදුස්සන් වන ආකාරයෙන් ජීවත් වීමට

අවශ්‍ය සියළු වරප්‍රසාද සහ ආශිර්වාද ඔවුන්ට දැනටමත් ලැබී ඇති බව පාවුලු තුමා පවසයි.

## මෙනෙහි කිරීම

කුඩා අවධියේ දී නත්තලේ මගේ වඩාත් ම සිත් ගත් අංගයන් වූයේ නත්තල් සීයා සහ මධ්‍යම රාත්‍රී පූජාවෙන් පසු මහා ශබ්ද නගමින් ගම වටේ ගිය කැරොල් කරත්තයි. කාලයත් සමග කැරොල් කරත්ත අභාවයට ගිය ද නත්තල් සීයා නම් වෙළඳුන්ගේ පිහිටෙන් තවමත් ජීවත් වෙයි. මගේ උපන් දිනය සැමරීමත්, ජේසුගේ උපන් දිනය සැමරීමත් අතර වෙනසක් එදා මට නොදැනිණි. දෙදිනට ම ප්‍රියසාද පැවැත්වේ, නෑදෑයින් රැස්වේ, නිවස සැරසිලි වලින් පිරේ, තෑගි බෝග ලැබේ. අවංකව ම කිවහොත් සාන්ත සභාව නත්තල සැමරීමේ අරමුණ ගැන මට පැහැදිලි අවබෝධයක් නොවීය.



**ඇත්තටම නත්තල යනු ඉතිහාසයේ වූ සිද්ධියක් නැවත නැවත සැමරීමක් පමණද? එය අප වාර්ෂිකව රඟ දක්වන නාට්‍යයක් ද? නැත. ජනවන්දනා පිළිවෙත් තුළ වසරින් වසරට කාලයෙන් කාලයට මාරු වෙමින් අප යන ගමන නාට්‍යයක කොටසක් නොව ජීවිතයේ ගැඹුරු යතාර්ථයන් සොයා යෑමකි; අප තුළ දෙවියන් වහන්සේගේ වැඩ සිටීම වඩා හොඳින් හඳුනා ගැනීමකි.** අප හුස්ම ගන්නා සෑම වාරයක් පාසාම තව තවත් වැඩියෙන් දෙවිඳුන්ට විවෘත වීමට අප තුළ ඉඩ නිර්මාණයවේ. දෙවියන් වහන්සේ සහ අප අතර සම්බන්ධය ගොඩනැගෙන්නේ ශරීරය හෝ මනස හරහා නොව ආත්මය තුළිනි. ඔබට ආත්මයක් ඇති බව ඔබ දන්නවාද? උන්වහන්සේට ඔබේ ආත්මයේ ඉඩ විවෘත කරනවාද? අවසාන මොහොත දක්වා ම වුවද අපේ ආත්මයට දෙවිඳුන්ගෙන් පිරෙන්නට ඇති ඉඩ කඩ නිමා නොවේ.

මෙය අපේ ගැලවීම සඳහා සම්පූර්ණයෙන් ම දෙවියන් වහන්සේගේ වරප්‍රසාදය මත අප යැපෙන බවට සළකුණකි. එදිනෙදා කරන ඕනෑම කාර්යයක දී අපට අවශ්‍ය වන්නේ ඒවා ඉක්මනින් අවසන් වනවා දැකීමට ය; අප සියළු දෙයින් සම්පූර්ණව සිටියැයි අපට ම දැනෙන්නට සලස්වා ගැනීමට ය. අධ්‍යාත්මික කාරණාවල දී ද මෙය එසේම ය. **අපි හැම අතින් ම නිවැරදි, තව දුරටත් සිත් හැරීමක් අවශ්‍ය නොවන, වෙනස් කරගත යුතු ගති නොමැති ඉතා හොඳ කිතුනුවන් ලෙස සිතාගෙන සිටීමට කැමැත්තෙමු. මෙය අපට ඇති ලොකුම දුර්පරීක්ෂාව වේ.** අද දින සුවිශේෂයේ ජේසුන් වහන්සේගේ වචන අවසාන විනිශ්චය පිළිබඳව කෙරෙන අවවාදයක් ලෙස පමණක් සිතිය යුතු නැත්තේ එහෙයිනි. එය අප අද දවස ගත කරන ආකාරය වෙතට කරන අභියෝගයකි; දැන් මේ ගෙවී යන මොහොතට අපව අවදි කිරීමකි. ආගමන කාලයේ පණිවිඩය ද එයම ය. අවදිව ඉන්න. දෙවියන් වහන්සේට විවෘත වීමට ප්‍රමාද නොවන්න.

අපේ පව් සහ අනිත් අයට අපේ අතින් සිදුවන හිරිහැර සම්බන්ධ කාරණා වලදී ඒවා ප්‍රතික්ෂේප කිරීමත්, අතපසු කිරීමත් අපේ සුලභ ගති ලක්ෂණ වේ. සත්‍යය යටපත් කිරීම සාමාන්‍ය දෙයක් බවට පත්ව ඇත. වැරදි පිළිගැනීම ද, ඒවා නිවැරදි කරගැනීමද සිදුවන්නේ ඉතාම කලාතුරකිනි. වරදින සෑම අවස්ථාවක ම ඒවායේ වගකීම් අනිත් අය මත පැටවීම අපේ ස්වභාවයයි. අප සැමවිටම පෙන්වන්නට උත්සහ කරන්නේ අපේ දුකට, කෝපයට හේතුව තවත් කෙනෙකුගේ වරදක්, හැසිරීමක් කියා නොවේද? දේශනා වලට ඇහුම්කන් දෙන්නේත්, මෙවැනි මෙනෙහි කිරීම් කියවන්නේත් අනිත් අයගේ වැරදි සිහිකරමින් නොවේද? 'අරයට නම් හොඳට වදින්න ඇති. බලමුකො දැන්වත් හැදෙයිද කියලා" ... මේ විදිහට හිතිලා නැද්ද? මගේ පවුලේ අය, වැඩපලේ අය, පන්තියේ අය හොඳ විය යුතුය. හැම ප්‍රශ්නයකට ම මූල ඔවුන් ය. දේශපාලකයෝත්, සභා නායකයෝත් ඉතුරු කොටසට වරදකරුවෝ ය. මට කිසිම පාපයක් නැත.

ආගමන කාලය මෙන් ම සෑම දිව්‍ය පූජාවක් ම ආරම්භවන්නේ අපේ පව් ගැන මනස්ථාපනය වීමෙන් සහ දේව කරුණාව අයැදීමෙනි. එහෙත් අප කෙතරම් දුරට මෙයට සංවේදී ද? "සියලු බලැති

දෙවියන් වහන්සේට ද සහෝදරවරුනි ඔබට ද මා පව් කළ බව කියමි. සිතින්, වචනයෙන්, ක්‍රියාවෙන් සහ අතපසු කිරීමෙන් බොහෝ පව් කළෙමි. ....." හැම ඉරිදාම කට පාඩමින් කියාගෙන් ගියත් 'මම පව්කාරයෙක්' යන හැඟීම අවංකව ම අප තුළ ඇතිවනවාද? පළමු කියවීමේ යෙසායාගේ වචන අපේ යාච්ඤාවක් බවට පත්කරගන්නේ කවදාද?

අපේ පාපිෂ්ඨ බව පිළිගැනීම දෙවියන් වහන්සේට විවෘත වීමට ඇති මාර්ගයයි. උන්වහන්සේ ජීවත් වන්නේ අප තුළමය. එහෙත් අපේ පව්කාරබව අපව උන්වහන්සේගෙන් දුරස්කර තබයි. තරුණ වයසේ දී පව්කාරයෙකුව සිට පසුව දෙවියන් වහන්සේ වෙතට පැමිණි මහා පඬිවර ශු. අගුස්තීනු තුමා මෙලෙස ලියා තබා ඇත. "මම ඔබවහන්සේට ප්‍රේම කරන්නට ප්‍රමාද වුණෙමි. ඔබවහන්සේ මා තුළ සිටි සේක. එහෙත් මා සිටියේ පිටත ය. මා පිටස්තර ලෝකය තුළ ඔබවහන්සේව සොයමින් සිටියෙමි. ඔබවහන්සේ මැවූ ලස්සන දෑ තුළ මම අවලස්සන ලෙස ගිලී සිටියෙමි. ඔබවහන්සේ මා සමඟ ම සිටි සේක. එහෙත් මම ඔබවහන්සේ සමඟ නොසිටියෙමි." තරුණ අගුස්තීනු සෑම තැනක ම දෙවියන් වහන්සේගේ ආදරය සොයමින් අසහනයට ද වෙහෙසට ද පත්ව සිටියේය. අවසානයේ දෙවියන් වහන්සේව ඔහුට සම්භවන්නේ කිසිසේත් ම බලාපොරොත්තු නොවන තැනකදී ය, එනම් ඔහු තුළම ය. දෙවියන් වහන්සේ සැමදාමත් ඔහු තුළ සිටි සේක. එතුමාණන්ගේ ආදරය ද ඔහු තුළ විය. එහෙත් ඔහු තමන් තුළ නොසිටි සේක.



**<u>අපේ ජීවිත කතන්දරය ද මීට සමානය. ලෝකයේ ඇති විවිධ දේ තුළ සතුට සොයන සෑම කෙනෙක් ම නොදැනුවත් ව සොයන්නේ දෙවියන් වහන්සේව ය. එහෙත් අප සොයන්නේ වැරදි තැනය.</u>** මොනතරම් දේ ලැබුණත්, කොපමණ බලාපොරොත්තු ඉෂ්ට වුණත් අප සෑහීමකට පත්නොවන්නේ ඒ නිසාය. අප සොයන සතුට, ආදරය ඇත්තේ දෙවියන් වහන්සේ තුළය. දෙවියන් වහන්සේ සිටින්නේ අප තුළ ය. එහෙත් අප පිටත ලෝකයේ අතරමං වී සිටිමු. අපේ ඇතුළාන්තය දෙසට හැරීමට නම් සිත් හැරීමක් අවශ්‍යය. අපේ පව්කාරකම පිළිගැනීමට එඩිතර විය යුතුය. ඒ සඳහා අවශ්‍ය සෑම ආශිර්වාදයක් ද, උපකාරයක් ද දෙවියන් වහන්සේ අපට ලබා දෙන බව ශු. පාවුලු තුමා කොරින්තිවරුන්ට මෙන්ම අපට ද මතක් කරදෙයි.

දේව වචනය හා ජනවන්දනාව තුළින් අපට ලැබෙන්නේ එම උපකාරයයි. අධ්‍යාත්මික නින්දකට වැටීමට සභා වත් පිළිවෙත් තුළ අපට ඉඩ නැත. ඒවා වසරින් වසරට විවිධ තේමාවන් ඔස්සේ අපව අවදි කරයි. එහෙයින් ඒවාට භක්තියෙන් සහභාගී වී මහඟු ඵල නෙළාගැනීම අපේ වගකීමයි.

ආත්මික අවදිවීම ක්ෂණයකින් හෝ කෙටි කාලයකින් අත්කර ගත හැකි දෙයක් නොවේ. ආත්මය අවදිවන්නේ ඉතා සෙමින්, ක්‍රම ක්‍රමයෙනි. **<u>පූර්ණ ලෙස අවදිවන විට අප කැඩපතක් ඉදිරියේ සිට ගෙන දෙනෙත් අරිනවා ලෙස දැනෙයි. එනම් ඔබට ඔබව වඩා හොඳින් දර්ශනය වන්නට පටන් ගනියි. දැන් ඔබට අනිත් අයගේ සිතුවිලි හොඳින් පෙනෙනවා මෙන් ඔබේම සිතුවිලි පෙනෙන්නට පටන් ගනියි. මෙය සුවිශාල ජයග්‍රහණයකි</u>**. බොහෝ දෙනෙකුට මෙම හැකියාව නැත. අපට අතරින් බොහෝ දෙනෙකුට ඇත්තේ ශරීරය සහ මනස පිළිබඳ අවබෝධය පමණි. ආත්මික මට්ටමින් තමන් දෙස බැලීමේ හැකියාව නැත. එසේ කළ හැකි බවවත් නොදනිති. මේ අවාසනාවක් නොවේද?

ඔබේ ශරීරය ඇතුළේ සිදුවන්නේ මොනවාදැයි කියා ඔබ දන්නවාද? ඔබ නොදැනුවත්ව පිළිකා සෛලයක් ඔබේ ශරීරය අත්පත් කරගනිමින් සිටිනවා වන්නට බැරිද? රුධිර නාල තෙල්, මේද වලින් අවහිර වෙමින් පවතිනවා වන්නට බැරිද? මෙවැනි දෙයක් සිදුවනවාට ඔබ අකමැති නිසා ඔබ විටින් විට වෛද්‍යවරයෙකු හමුවී පරීක්ෂාවන් කරගනියි. එවිට ඔබට ශරීරය ගැන වඩා හොඳ අවබෝධයක් ලැබේ. දැන් ඔබ ශරීරය ගැන අවදියෙන් පසුවේ. මෙම අවබෝධය ආත්මය ගැන ලබා ගත යුතු නැද්ද? ඔබ පරීක්ෂා කර නොබලන නිසා ආත්මය තුළ මොනවා සිදුවෙමින් පවතිනවාදැයි ඔබ දන්නේ නෑ නේද? එය

දැන ගැනීම වැදගත් නැද්ද? **මොනවද ඒ සඳහා කළ යුතු පරීක්ෂාවන්? සක්‍රමේන්තු, පුද්ගලික යාච්ඤාව, ආත්ම සෝදිසිය, දේව වචනයේ ඇසුර, අධ්‍යාත්මික මග පෙන්වීම... මේ දේවල් වලට යොමු වන විට, ඔබේ ආත්මයේ සිදුවන දේ ඔබට පෙනෙන්නට පටන් ගනියි. අසනීප ඇත්නම් ප්‍රතිකාර ගැනීමට යොමු වීමට ඔබට අවකාශ ලැබේ.** යහපත් තැන් තවත් ශක්තිමත් කරගැනීමට හැකියාව ලැබේ. ආගමන කාලය ඒ සඳහා නොවේද?

ගෘහපතියා නැවත පැමිණෙන තෙක් "සේවකයින්ට" බලය පවරා ගියාක් මෙන් ක්‍රිස්තුන් වහන්සේ නැවත පැමිණෙන තෙක් 'අවදිව සිටින්න' යැයි පැවසුවේ සාන්ත සභාවට, එනම් අපට ය. උන්වහන්සේගේ අණට අප විශ්වාසවන්ත වී ඇත්ද? මේ වනතෙක් ඒ බවක් පෙනෙන්නට නැත. එහෙත් වාසනාවකට අප තවමත් ප්‍රමාද වැඩි නැත. පසුතැවිලි වීමට කාලය ද අවස්ථාව ද උදා වී ඇත. වැරදි අවබෝධ කරගැනීමට ද, පිළිගැනීමට ද හැකියාව තවමත් ඇත. හොඳ පාපොච්චාරණයක් තුළින් නැවත දෙවියන් වහන්සේ වෙතට ළඟා වෙමු. දෙදහස් වසරකට පෙර බෙත්ලෙහෙමේ උපන් ජේසු බිළිඳුන්ට නැවත වරක් අප හදවත් තුළ ජීවමාන වන්නට එවිට ඉඩ ලැබෙනු ඇත. දුර්වර්ණ වී ඇති අපේ ඇතුළාන්තය පිරිසිදු කර, අලංකාර කර ඒ තුළින් නත්තලේ බාහිර සැමරුම් වලට අරුතක් ලබා දෙමු. එළඹෙන නත්තල වචනාර්ථයෙන් ම 'නියම' නත්තලක් කරගනිමු.

*"ජේසු සමිඳුනි, මේ නත්තලේ දී මගේ හදවත තුළ ඔබවහන්සේ ඉපදුණ මැනව. ඒ සඳහා ඉදිරි සති හතර තුළ මා සූදානම් කළ මැනව. ඔබවහන්සේ මා තුළ සැමදා ජීවත් වුව මැනව."*

*irudinasupuwatha@gmail.com*

